**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය - 2021**

---

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක.9186-එස් ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතුයයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන සහ ව්‍යාපෘති ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුර පලාතේ යාපනය ප්‍රදේශයේ කුඩා හුදකලා දූපත් 03 (නයනතිව්, අනලතිව් හා එළුවතිව්) තුල වූ ග්‍රාමීය ප්‍රජාව සඳහා එලදායී බලශක්ති භාවිතයට සහය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. බාහිරව මුදල් යෙදවීමට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර වූ ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 288 කට සමාන එජඩො මිලියන 2 ක් වන එම මුදල ආසියානු සංවර්ධන බැංකුව විසින් පරිපාලනය කරනු ලබන දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු පිරිවැයෙන් රු.මිලියන 180.72 කට සමාන එජඩො මිලියන 1.25 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වෙන්කර තිබූ අතර රු.මිලියන 106.56 සමාන එජඩො මිලියන 0.75 ක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2017 මාර්තු 19 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.2 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක MOFP/ERD/2007/02 දරන චක්‍රලේඛය අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2022 අගෝස්තු 04 දින ඉදිරිපත් කර තිබුණි. | රටතුළ පවතින ආර්ථික හා මූල්‍ය අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් සීමිත කාර්යය මණ්ඩලය, සේවා කාලය සීමා කිරීම, ඉන්ධන හිඟය හා ප්‍රවාහනය කෙරෙහි අහිතකර බලපෑම මත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2022 මාර්තු 31 දින හෝ ඊට පෙර ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු අතර අනාගතයේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 2.2 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | විගණන නිරීක්ෂණය | මුදල<br>රු.මිලියන | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 208.88 කි. කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු.මිලියන 258.66 ක් ලෙස පෙන්වා ඇත. මේ සම්බන්ධ වෙනස සැසඳීම සඳහා කටයුතු කර නොතිබුණි. | 49.98 | ව්‍යාපෘතියේ වියදම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වියදම් සමඟ සැසඳන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය අංශය වෙත ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘතිය විස්තරාත්මක කෙරීගෙනයන වැඩ (WIP) සැසඳුම සකස් කරමින් පවතී. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අදාළ වාර්තා සමඟ ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ ශේෂය සැසඳීම සඳහා වහාම පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යය සාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ සංරචක දෙකකින් සමන්විත වේ. එනම් නයිනතිව් දූපතේ දිනකට ඝන මීටර් 150 මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත සමඟ ඒ ආශ්‍රිත සිවිල් කටයුතු සැපයීම් හා ස්ථාපනය කිරීම සහ දිනකට ටොන් 2 ක අයිස් සෑදීමේ කර්මාන්තශාලාවක් හා ශීතකරණ පද්ධතියක් ඉදිකිරීම. ඉන් දිනකට ටොන් 2.0 ක අයිස් සෑදීමේ කර්මාන්ත ශාලාවක් සහ ශීතකරණ පද්ධතියක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම ලංකා විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් විදුලිබල පද්ධති ව්‍යාපෘතියෙන් විදුලි සැපයුම් ලබා නොදීම හේතුවෙන් අත්හිටුවන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය කිසිඳු භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 89 ක් සහ සියයට 72.53 ක් විය. 2021 දෙසැම්බර් 31 දිනට සංරචක අනුව ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | ව්‍යාපෘති සංරචක | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | දිනකට ඝණ මීටර් 150 ක මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත සහ ඒ ආශ්‍රිත සිවිල් කටයුතු සැපයීම හා ස්ථාපනය කිරීම | 2021 දෙසැම්බර් 16 වන දින මෙම කොන්ත්‍රාත්තුව යටතේ මෙහෙයුම් සහ නඩත්තු මෙවලම් සඳහා ගෙවීම් සිදු කර තිබුණද, 2022 අගෝස්තු 31 දින දක්වා මෙම පිරියතට අදාල මෙහෙයුම් හා නඩත්තු මෙවලම් කොන්ත්‍රාත්කරු විසින් ලබාදී නොතිබුණි. | මෙහෙයුම් හා නඩත්තු මෙවලම් කොටසක් හැර අනෙකුත් සියලු දෝෂ දැනටමත් නිවැරදි කර ඇත. මෙම මෙවලම් දේශීය වෙළඳපොල තුළ නොමැති අතර රටෙහි පවතින අර්බුදය හේතුවෙන් සැපයීම ප්‍රමාද වේ. මෙම මෙවලම් පිටරටින් ආනයනය කිරීමෙන් 2022 සැප්තැම්බර් මස අවසානයේ ලබා දෙනු ඇත. | මෙයට අදාල මෙවලම් තවදුරටත් ප්‍රමාද නොකර ලබාදීමට උපදෙස් ලබා දිය යුතුය. |
| (ආ) | දිනකට ටොන් 2 ක අයිස් සෑදීමේ කර්මාන්ත ශාලවක් සහ ශීතකරණ පද්ධතියක් ඉදිකිරීම | ආසියානු සංවර්ධන බැංකු දූත මණ්ඩල සංචාරයේදී මෙම සංරචකය ව්‍යාපෘති විෂය පථයෙන් ඉවත්කිරීමට ආසියානු සංවර්ධන බැංකුව තීරණය කර තිබුණි. | ආසියානු සංවර්ධන බැංකු දූත මණ්ඩල සංචාරය අතරතුරදී දායක නියෝජිතායතනයේ (ADB) කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ලැයිස්තුවෙන් මෙම යෝජනාව ඉවත් කිරීමට තීරණය කර ඇත. | ව්‍යාපෘතියේ වෙනත් වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රදානයේ ඉතිරි මුදල භාවිතා කිරීමට දායක නියෝජිතායතනය සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කල යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිනකට ඝන මීටර් 150 මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත පිරියත (SWRO) සැපයීම සහ ස්ථාපනය කිරීම සමඟ අදාළ සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 31 දින අවසන් කර භාරදී තිබුණි. ඒ අනුව, මෙහෙයුම් හා නඩත්තු කාලය 2021 දෙසැම්බර් 31 දින වන විට අවසන්ව ඇත. 2021 දෙසැම්බර් 16 දින බිල් අංක III හි අයිතම අංක 14 යටතේ මෙහෙයුම් හා නඩත්තු මෙවලම් සඳහා ගෙවීම් කර ඇති අතර, මෙහෙයුම් හා නඩත්තු සම්බන්ධ මෙවලම් 2022 අගෝස්තු 31 දින දක්වා කොන්ත්‍රාත්කරු විසින් ලබාදී නොතිබුණි. තවද, විදුලිය විසන්ධි වීම් සහ දූපත් තුනෙහි ජල කුළුණු සහ බෙදාහැරීමේ නල පද්ධතිය නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් දිනකට ඝණ මීටර් 150 ක බලාගාරයේ ධාරිතාවය වෙනුවට දළ වශයෙන් ඝණ මීටර 90 ක ජල ප්‍රමාණයක් 2022 පෙබරවාරි 28 දින වන විට දෛනිකව නිෂ්පාදනය කරන බව නිරීක්ෂණය කෙරේ. | මෙම මෙවලම් දේශීය වෙළඳපොල තුල නොමැති අතර රටේ පවතින අර්බුදය හේතුවෙන් සැපයීම් ප්‍රමාද වේ. මෙම මෙවලම් පිටරටින් ආනයනය කිරීමෙන් 2022 සැප්තැම්බර් මස අවසානයේ ලබා දෙනු ඇත. එසේම දූපත්වල ජල කුළුණු සහ බෙදාහැරීමේ ජාලය ඉදිකිරීම් දැනටමත් අවසන් කර ඇති අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු අංශය නයිනතිව් දූපතේ ගෘහස්ථ සම්බන්ධතා සැපයීම ආරම්භ කර ඇත. | ගෘහස්ත සම්බන්ධතා සැපයීම් කඩිනම් කල යුතු අතර තවදුරටත් ප්‍රමාද නොකර මෙහෙයුම් හා නඩත්තු මෙවලම් ලබාදීමට උපදෙස් ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නයිනතිව් දූපතේ ප්‍රජාවගේ ප්‍රධාන ජීවනෝපාය මසුන් ඇල්ලීම වන අතර දූපත තුළ මසුන් කල්තබා ගැනීම දිගුකාලීන අපේක්ෂාව වේ. එබැවින්, නයිනතිව් දූපතේ ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා දිනකට ටොන් 2 ක කුඩා අයිස් සාදන කර්මාන්ත ශාලාවක් සහ ශීතකරණ පද්ධතියක් ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව මූල්‍ය ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, නයිනතිව් දූපතට ලංකා විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් බලශක්ති පද්ධති ව්‍යාපෘතියෙන් ලැබෙන විදුලිබල සැපයුම මත අයිස් සෑදීමේ කාර්මාන්තශාලාවේ ක්‍රියාකාරීත්වය රඳා පවතී. එබැවින්, දෙමුහුන් බලශක්ති පද්ධති ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කරන තෙක් අයිස් නිෂ්පාදන කර්මාන්තශාලාව සඳහා ටෙන්ඩර් කැඳවීම කල් දමා තිබුණි. එසේ වුවද, ආසියානු සංවර්ධන බැංකුව විසින් දෙමුහුන් බලශක්ති පද්ධතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා නොදෙන බැවින් 2022 පෙබරවාරි 24 සිට 27 දක්වා කාලය තුළ ආසියානු සංවර්ධන බැංකු මෙහෙයුමේදී මෙම සංරචකය ව්‍යාපෘති විෂය පථයෙන් ඉවත් කිරීමට තීරණය කර තිබුණි. | මෙය ලංකා විදුලිබල මණ්ඩලයේ දෙමුහුන් බලශක්ති පද්ධති ව්‍යාපෘතිය මත රඳා පවතින අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාලනයෙන් තොරව පවතී. ආසියානු සංවර්ධන බැංකු මෙහෙයුමේදී දායක නියෝජිතායතනයේ (ADB) කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ලැයිස්තුවෙන් මෙම යෝජනා ඉවත් කිරීමට තීරණය කර ඇත. | ව්‍යාපෘතියේ වෙනත් වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රදානයේ ඉතිරි මුදල භාවිතා කිරීමට දායක නියෝජිතායතනය සමඟ සාකච්ජා කිරීමට කටයුතු කල යුතුය. |
| ඇ | මෙම ව්‍යාපෘතිය මගින් නයිනතිව්, අනලතිව් සහ එළුවතිව් යන දූපත් 03 ක ජල සම්බන්ධතා 1,170 ක් මුහුදු ජලය ප්‍රතිආශ්‍රිත (SWRO) පිරියත හරහා ලබාදීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, නව ජල කුළුණු ඉදිකිරීම් සහ ජල සම්බන්ධතා සඳහා බෙදාහැමේ නල එළීම් මෙම ව්‍යාපෘති විෂය පථයට ඇතුලත් නොවූ අතර එය යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතියට සමාන ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියක් මඟින් නිම කිරීමට නියමිතව තිබුණි. එසේ වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විට මෙම දූපත්වල ජල කුළුණුවල ප්‍රගතිය සියයට 88 සිට සියයට 92 දක්වා පරාසයක වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට නල එලීමේ කටයුතු වලින් අවසන් කර තිබුණේ මීටර් 29,700 න් මීටර් 14,594 ක් පමණි. තවද, 2022 ජූනි 30 දින දක්වාත් ජල කුළුණු සහ නළ එලීමේ කටයුතු දෙකම සම්පූර්ණයෙන් නිම කර නොතිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 දෙසැම්බර් 31 දින වන විට නයිනතිව් දූපතේ පවතින ජල ටැංකිය හරහා සම්බන්ධතා 175 ක් පමණක් ලබාදී තිබුණි. | දූපත්වල ජල කුළුණු සහ බෙදාහැරීමේ ජාලය ඉදිකිරීම දැනටමත් අවසන් කර ඇති අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු අංශය නයිනතිව් දූපතේ ගෘහස්ථ සම්බන්ධතා සැපයීම ආරම්භ කර ඇත. | ගෘහස්ථ සම්බන්ධතා සැපයීම කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

**3.3 පද්ධති හා පාලනය**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| අ) | 2010 ජුලි 26 දින කළමණාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05ට අනුව, ව්‍යාපෘතියේ ගණුදෙනු ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ අභ්‍යන්තර අංශය විසින් විගනණයට භාජනය කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ගණුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොමැති බවට ජාතික විගණන කාර්යාලයේ විගණන නිරීක්ෂණ යොමුකර ඇති බැවින් ව්‍යාපෘතියේ විගණනය සිදු කර විගණන වාර්තා ඉදිරිපත් කරන ලෙස ව්‍යාපෘතිය ඉල්ලා සිටි බව ඔබට දැනුම් දෙමි. | අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට වහාම පියවර ගත යුතුය. |